මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක : **PRE/2024/103**

**2024.09.20**

## ජනාධිපතිවරණය - 2024 සැප්තැම්බර් 21

### ආබාධ සහිත තැනැත්තන් අන්තර්කරණය කර ගැනිම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් ලබා දී ඇති පහසුකම්

ජනාධිපතිවරණයේ දී ආබාධ සහිත ඡන්දදායකයින්හට කිසිදු අපහසුතාවයකින් තොරව ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබාදීම වෙනුවෙන් සියලු ඡන්ද මධ්‍යස්ථාන තුළ ආබාධ සහිත ඡන්දදායකයින් සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් පහත සඳහන් පහසුකම් සැපයීමට කටයුතු කර ඇත .

- සහායකයකු කැටුව යාම සඳහා අවසර ලබා දීම.
- විශේෂ ප්‍රවාහන පහසුකම් ලබා ගැනීමට අවසර ලබා දීම .
- කායික දුබලතාවයෙන් යුතු තැනැත්තන් සඳහා ඡන්ද මධ්‍යස්ථානයට ඇතුළුවීමේ දොරටුවේ සිට ඡන්ද පොළ පැවැත්වෙන ගොඩනැගිල්ල දක්වා මීටර් 100ට වඩා වැඩි දුරක් තිබේ නම් එම ගොඩනැගිල්ල දක්වා ත්‍රිරෝද රථ මඟින් ප්‍රවාහන පහසුකම් සැලසීම.
- දෘශ්‍යාබාධ සහිත ඡන්දදායකයින්හට ඡන්දය සලකුණු කිරීම සඳහා ස්පර්ශක රාමුව භාවිත කිරීමට අවශ්‍ය පහසුකම් සපයා තිබීම.
- මැතිවරණ කොමිෂන් සභාව විසින් ආබාධ සහිත තැනැත්තන් සඳහා නිකුත් කරන ලද තාවකාලික හැඳුනුම්පත ඡන්ද පොළේ දී පිළිගත් වලංගු හැඳනුම්පතක් ලෙස නම් කර තිබීම.
- ඡන්ද පොළ තුළ ප්‍රදර්ශනය කරන දැන්වීම්, සංඥා භාෂා වෙන් රූපසටහන් සහිතව ප්‍රදර්ශනය කර තිබීම.
- ඡන්ද ප්‍රතිඵල විකාශනයන් සංඥා භාෂා පරිවර්තන සහිත ව විකාශනය කිරීම.
- වෙනත් පොදු පහසුකම් හා ආබාධ සහිත තැනැත්තන්ට සපයා ගැනීමට අවසර දී ඇති පහසුකම්;
    - ඡන්ද සලකුණු කරන කුටිය තුළ ප්‍රමාණවත් ආලෝකය ලැබෙන ස්ථානයක ස්ථානගත කිරීම හා හැකි නම් විදුලි අලෝකය සැපයීමට කටයුතු කිරීම.
    - ඡන්ද පෙට්ටිය තබන මේසය අඩු උස මට්ටමක තිබීම. (රෝද පුටු භාවිත කරන තැනැත්තන් සහ මිහිමිත් තැනැත්තන්ට පහසු වන සේ)
    - අර්ධ දෘශ්‍යාබාධ සහිත තැනැත්තන් සඳහා අකුරු විශාලකර පෙන්වීමේ උපකරණ (අත්කාච, විශේෂ උපැස් යුවල් වැනි දෑ ) ඡන්ද මධ්‍යස්ථානයට රැගෙන ආ හැකි බැවින් ඒවා භාවිත කිරීමට අවසරය ලබා දීම.
    - ඡන්ද පත්‍රිකාව කියවා ගත නොහැකි තැනැත්තන් සහ පැහැදිලි කර දීමක් අවශ්‍ය වන තැනැත්තන් සඳහා අවශ්‍ය පරිදි පැහැදිලි කිරීම් සිදු කිරීම සහ ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාදීම.

එමෙන්ම ආබාධ සහිත ඡන්දදායකයින් වෙත කිසිදු බාධාවකින් තොරව ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබාදීම වෙනුවෙන් මැතිවරණ රාජකාරිවල නියුතු ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා ඇතුළු සියලු කාර්ය මණ්ඩලය වෙත මැතිවරණ කොමිෂන් සභාව විසින් ලබා දී ඇති උපදෙස් හා විධිවිධාන අනුගමනය කළ යුතු බව මෙයින් නිවේදනය කරමි.

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්

(+94)112868441-42-43 (+94)112868426 info@elections.gov.lk www.elections.gov.lk Election Commission of Sri Lanka SriLankaElectionCommission elecomsl